**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය – 2013**

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්තවාගණනය කරනු ලැබේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීමේදී, වත්කම් භාවිතය සඳහා යෝග්‍ය තත්ත්වයට පත්කළ දින සිට ක්ෂය කළ යුතු වුවද, ආයතනය විසින් වත්කම් මිලදී ගත් වර්ෂයේ ක්ෂය නොකිරීම හා වත්කම් ඉවත්කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙන්කිරීම වර්ෂය තුළ මිලදී ගත් වත්කම් වෙනුවෙන් රු.45,919 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 40(5) වගන්තිය | කළමනාකරණ මණ්ඩල සාමාජිකයකු රැස්වීම් වාර 03 කට අඛණ්ඩව සහභාගි නොවන්නේ නම් වෙනත් සාමාජිකයකු පත්කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අඛණ්ඩව රැස්වීම් වාර 08 කට නොපැමිණි නිළධාරියෙක් වෙනුවට වෙනත් නිලධාරියෙකු පත්කිරීම ප්‍රමාද කර තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ xx පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාල සේවයේ නියුක්ත සෑම තැනැත්තකුම පැමිණීම හා පිටවීම සටහන් කළ යුතු වුවද, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, 2013 වර්ෂය වෙනුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා වශයෙන් රු.4,735,312 ක් ගෙවා ඇතත් එම ගෙවීම සනාථ කිරීම සඳහා වූ පැමිණීමේ ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලියේ 4(ඇ) හා (ඉ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ කෙටිකාලීන පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,413,496 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,081,211 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,332,285 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අයදුම්පත්‍ර ආදායම රු.26,000 කින් අඩුවී තිබුණි. තවද 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ 04 කදී පශ්චාත් උපාධි සුදුසුකම ලබාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව 18 ක් විය.

(ආ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීමේ පශ්චාත් උපාධි පාඨමාලාව (Teaching English Literature in the Second Language Context) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ ලැබී තිබුණද, විගණිත දින (2014 අප්‍රේල් 03) වන විටත් පාඨමාලා සකස් කිරීම පිළිබඳ කටයුතු, ඉගෙනුම් ආධාරක සැකසීම සහ නිති රීති සහ නියමයන් සම්පාදනය කිරීම නිමකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මූල්‍ය කටයුතු සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබාගැනීම සඳහා මූල්‍ය කමිටුවක් ස්ථාපිතකර නොතිබුණි. මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති එක් නිලධාරියකුගෙන් පමණක් සමන්විත කළමනාකරණ රැස්වීම් වලදී අදාළ මූල්‍ය ගැටළු සාකච්ඡා කර ඇති බව නිරීක්ෂණය විය.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

2013 වර්ෂයේ යන්ත්‍ර, ලීබඩු හා කාර්යාල උපකරණ සහ පොත් හා සඟරා මිලදී ගැනීම සඳහා රු.4,401,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, එම ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,253,413 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව අධි ප්‍රතිපාදන අනුමත කරවා ගැනීම නිසා 2013 වර්ෂයේ එම වෙන්කල ප්‍රතිපාදන වලින් රු.3,225,092 ක් වැයකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි ආයතනයේ කටයුතු වලින් සියයට 60 ක් පරික්ෂා කරන බව සඳහන් වී තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා විගණන විමසුම් 02 ක් පමණක් නිකුත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

තථ්‍ය ආදායම, අයවැයගත ආදායමට වඩා සියයට 244 කින් ඉක්මවා තිබූ අතර තථ්‍ය පුනරාවර්තන වියදම්, අයවැයගත පුනරාවර්තන වියදමට වඩා සියයට 98 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය හා කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ආයතනයේ 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පහත පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය
(ආ) සේවක කළමනාකරණය
(ඇ) අධ්‍යයන කටයුතු කළමනාකරණය